[සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

සාමාන්‍ය පොදු පරීක්ෂණය
பொதுச் சாதாரணப் பரீட்சை
Common General Test

**12 S**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- ✳ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- ✳ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත්ව කියවා පිළිපදින්න.
- ✳ 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරා ගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද නවතම සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ අඩුතම ජනගහනය සහිත දිස්ත්‍රික්ක වනුයේ,
(1) මාතලේ හා කෑගල්ල ය.
(2) කිලිනොච්චි හා මන්නාරම ය.
(3) වවුනියා හා මුලතිව් ය.
(4) මොනරාගල හා පොළොන්නරුව ය.
(5) මන්නාරම හා මුලතිව් ය.

**2.** සෞරග්‍රහ මණ්ඩලයෙහි 'රතු ග්‍රහයා' ලෙස හඳුන්වනු ලබන ග්‍රහලෝකය දෙස පෘථිවියෙහි සහ අභ්‍යවකාශයෙහි සිට බලනවිට එයට රත් පැහැ පෙනුමක් ලබාදෙන්නේ යකඩ ඔක්සයිඩ මගින් එහි පෘෂ්ඨය ආවරණය වී ඇති නිසා ය. එම ග්‍රහලෝකයෙහි නම කුමක් ද?
(1) බුධ (2) අඟහරු (3) සිකුරු (4) සෙනසුරු (5) බ්‍රහස්පති

**3.** 2025 සැප්තැම්බර් මාසයේ දී ඇති වූ දේශපාලන ආරවුලක් හේතුවෙන් දකුණු ආසියාතික රටක් බරපතල සමාජ ආර්ථික අර්බුදයකට මුහුණ පෑවේ ය. මෙම රට පහත දැක්වෙන ඒවායින් කවරක් ද?
(1) ඉන්දියාව (2) පාකිස්ථානය (3) බංග්ලාදේශය (4) මාලදිවයින (5) නේපාලය

**4.** ICC ලෝක ටෙස්ට් ශූරතා අවසාන තරගය (2025) යනු 2023-2025 ICC ලෝක ටෙස්ට් ශූරතා ජයග්‍රාහකයා නිරණය කිරීම සඳහා 2025 ජුනි 11-14 දිනවල ලන්ඩන්හි ලෝඩ්ස් පිටියේ පැවති ටෙස්ට් ක්‍රිකට් තරගයයි. එහි දී තරග වැදුනේ,
(1) ඔස්ට්‍රේලියාව සහ දකුණු අප්‍රිකාවයි.
(2) එංගලන්තය සහ ඔස්ට්‍රේලියාවයි.
(3) එංගලන්තය සහ දකුණු අප්‍රිකාවයි.
(4) නවසීලන්තය සහ පාකිස්ථානයයි.
(5) දකුණු අප්‍රිකාව සහ ඉන්දියාවයි.

AL අපි | @AL_api

**5.** පළාත් සභාවක ප්‍රධාන අමාත්‍යවරයාගේ සහ අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ,
(1) මධ්‍යම රජයේ නියෝජිතයා ලෙස කටයුතු කිරීමයි.
(2) ආපදා අවස්ථාවල දී ජනාධිපතිවරයාගේ උපදෙස් අනුව කටයුතු කිරීමයි.
(3) පළාතේ ප්‍රාදේශීය පරිසරය සුරැකීමයි.
(4) ජනතාවගේ දේශපාලනික, ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතීන් සුරැකීමයි.
(5) ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ එදිනෙදා පරිපාලනය කළමනාකරණය කිරීමයි.

**6.** රටක ජනගහනයේ මූලික අවශ්‍යතා කොතෙක් දුරට සපුරාලන්නේ දැයි තක්සේරු කිරීම සඳහා ප්‍රධාන දර්ශක (indicators) තුනක් පදනම් කරගෙන මනිනු ලබන දර්ශකය (index) කුමක් ද?
(1) ඒක පුද්ගල ආදායම් දර්ශකය
(2) මානව සංවර්ධන දර්ශකය
(3) ජීවිතයේ භෞතික ගුණාත්මක දර්ශකය
(4) මානව දරිද්‍රතා දර්ශකය
(5) වින්දන දර්ශකය

**7.** "වඩාත් අන්තර්කරණ හා තිරසර පාලනයක් සඳහා ගෝලීය දක්ෂිණ සහයෝගිතාව සවිබලගැන්වීම" යන තේමාව යටතේ 17 වන බ්‍රික්ස් (BRICS) සමුළුව 2025 ජූලි මාසයේ දී පැවැත්විණි. මෙම සමුළුව පැවැත්වූයේ කුමන රටෙහි ද?
(1) බ්‍රසීලය (2) රුසියාව (3) ඉන්දුනීසියාව (4) සවුදි අරාබිය (5) චීනය

**8.** කැල්සියම් කාබයිඩ් වැනි අනතුරුදායක ද්‍රව්‍ය අඩංගු බහාලුම් 640ක් ගෙන යමින් තිබූ ලයිබීරියානු භාණ්ඩ ප්‍රවාහන නෞකාවක්, 2025 මැයි මාසයේ දී ඉන්දියාවේ කොච්චින් වෙරළට ඔබ්බෙන් මුහුදුබත් විය. මෙම භාණ්ඩ ප්‍රවාහන නෞකාවේ නම කුමක් ද?
(1) MSC Elsa 3
(2) Mt New Diamond
(3) X - Press Pearl
(4) MSC Tessa
(5) MV Sea Star

[දෙවැනි පිටුව බලන්න

**9.** ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා 2025 සැප්තැම්බර් මස අග දී රාජ්‍ය තාන්ත්‍රික සංචාරයක යෙදුනු රටෙහි නම කුමක් ද?
(1) චීනය (2) ඉන්දියාව (3) ජර්මනිය
(4) ජපානය (5) එක්සත් රාජධානිය

**10.** Space X නමැති අභ්‍යවකාශ ප්‍රවාහන සේවා සමාගමට අයත් අධිවේගී චන්ද්‍රිකා අන්තර්ජාල සේවාවක් වන Starlink පැහැප දී ශ්‍රී ලංකාවෙහි ස්ථාපිත කරන ලදී. Space X හි සමාරම්භකයා වන්නේ කවරෙක් ද?
(1) එලොන් මස්ක් (2) නාදන් බෙන්ස් (3) මෙරෙඩිත් රාවුල්ස්
(4) වූ යුන්හුවා (5) ජෝසෆ් වැන්ග්

- අංක **11** සහ **12** ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

එක්තරා පාසලක ශිෂ්‍යයෝ 200 දෙනෙක් පසුගිය වර්ෂයේ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටියහ. ඔවුන් අතුරෙන් 35.0% ක් වාණිජ්‍ය ශිෂ්‍යයෝ ද 10.0% ක් කලා ශිෂ්‍යයෝ ද වූහ. විභාගයට පෙනී සිටි ශිෂ්‍යයන්ගෙන් 80.0% ක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූහ. විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් අතුරෙන් 30.0% ක් වාණිජ්‍ය ශිෂ්‍යයෝ ද 7.5% ක් කලා ශිෂ්‍යයෝ ද වූහ.

**11.** වාණිජ්‍ය ශිෂ්‍යයන් කීදෙනෙක් විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලබා තිබේ ද?
(1) 9 (2) 21 (3) 48 (4) 49 (5) 56

**12.** කලා ශිෂ්‍යයන්ගෙන් කවර ප්‍රතිශතයක් විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලබා තිබේ ද?
(1) 48.0% (2) 56.0% (3) 60.0% (4) 64.0% (5) 72.0%

**13.** එක්තරා මහනගර සභාවක් 2025 වර්ෂය තුළ දේපළ සඳහා වරිපනම් බද්ද 12% කින් වැඩි කළේ ය. බදු ගෙවන්නන් වර්ෂය සඳහා මුළු බදු මුදල ම ජනවාරි මාසය තුළ දී ගෙවන විට 10% ක වට්ටමක් දෙනු ලැබේ. එක්තරා දේපළක බදු ගෙවන්නෙක් තම දේපළ සඳහා වරිපනම් බදු ලෙස රු. 12 600.00 ක මුදලක් 2025 ජනවාරි 16 වන දින ගෙව්වේ ය. මෙම දේපළ සඳහා 2024 වර්ෂයේ වරිපනම් බද්දට සාපේක්ෂව 2025 වර්ෂය සඳහා බදු ගෙවන්නාට ගෙවීමට සිදු වූ අතිරේක මුදල කොපමණ ද?
(1) රු. 100.00 (2) රු. 250.00 (3) රු. 650.00 (4) රු. 720.00 (5) රු. 950.00

**14.** දොඩම් බීමක අන්තර්ගතයෙන් 50% ක් පලතුරුවලින් සමන්විත වේ. මෙම බීම සෑදීම සඳහා සංශුද්ධ දොඩම් යුෂ ජලය සමග තනුක කරනු ලැබේ. බීමෙහි පලතුරු අන්තර්ගතය සඳහා සැබෑ පිරිවැය, මෙහි ලකුණු කර ඇති සිල්ලර මිලෙන් $\frac{1}{3}$ කි. පලතුරු අන්තර්ගතය 60% තෙක් වැඩි කළහොත්, ලකුණු කරනු ලබන සිල්ලර මිල කවර ප්‍රතිශතයකින් වැඩි කළ යුතු වේ ද?
(1) 10% (2) 15% (3) 20% (4) 25% (5) 30%

**15.** පියෙක්, ඔහුගේ රු. මිලියන 8 ක් වටිනා චංචල දේපළ සහ රු. මිලියන 115 ක් වටිනා නිශ්චල දේපළවලින් 60% ක් තම එක ම පුතාට ද නිශ්චල දේපළවලින් ඉතිරි 40% තම එක ම දුවට ද ඔහුගේ අන්තිම කැමති පත්‍රයෙන් පවරා දෙයි. එසේ ම මව ඇයගේ රු. මිලියන 7 ක් වටිනා චංචල දේපළ සහ රු. මිලියන 120 ක් වටිනා නිශ්චල දේපළවලින් 60% ක් තම දුවට ද නිශ්චල දේපළවලින් ඉතිරි 40% තම පුතාට ද ඇයගේ අන්තිම කැමති පත්‍රයෙන් පවරා දෙයි. පුතා සහ දුව ලැබූ මුළු වත්කම්වල අනුපාතය කුමක් ද?
(1) 13:11 (2) 14:13 (3) 1:1 (4) 13:14 (5) 11:13

**16.** P නම් සීඝ්‍රගාමී දුම්රියක් සහ Q නම් මන්දගාමී දුම්රියක් X හා Y නම් ප්‍රධාන දුම්රිය ස්ථාන දෙකක් අතර ක්‍රියාත්මක වෙයි. එක්තරා දිනක පෙ.ව. 08.00 ට Q දුම්රිය, X සිට Y තෙක් තම ගමන ආරම්භ කරන අතර, $40\ km\,h^{-1}$ ඒකාකාර වේගයෙන් ගමන් කරයි. පෙ.ව. 08.30 ට P දුම්රිය, X සිට තම ගමන ආරම්භ කරන අතර $60\ km\,h^{-1}$ ඒකාකාර වේගයෙන් Y දෙසට ගමන් කරයි. P දුම්රියට Q දුම්රිය පසු කිරීමට සිදුවන්නේ කුමන වේලාවට ද?
(1) පෙ.ව. 08.30 (2) පෙ.ව. 09.00 (3) පෙ.ව. 09.30 (4) පෙ.ව. 10.00 (5) පෙ.ව. 10.30

**17.** 2025 වර්ෂයේ දි මිත්තණියකගේ වයස ඇගේ මිනිබිරියගේ වයස මෙන් පස්ගුණයක් වෙයි. එම වර්ෂයේ දි මිත්තණියගේත් මවගේත් වයස්වල අනුපාතය 10:6 වේ. මිනිබිරිය ඉපදුනේ 2011 වර්ෂයේ දී නම්, මිත්තණියගේත්, මවගේත් උපන් වර්ෂ පිළිවෙලින් මොනවා ද?
(1) 1950, 1981 (2) 1952, 1982 (3) 1955, 1983 (4) 1956, 1984 (5) 1957, 1985

**18.** එක්තරා පාසලක සියලු ම ශිෂ්‍යයන් අඩු ම තරමින් එක් ගෘහස්ථ ක්‍රීඩාවකට හෝ එක් එළිමහන් ක්‍රීඩාවකට හෝ සහභාගි විය යුතු වේ. ගෘහස්ථ ක්‍රීඩාවලට ලියාපදිංචි වන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව, ගෘහස්ථ ක්‍රීඩාගාරයෙහි ධාරිතාව වන 750 නොඉක්මවීම සහතික කිරීම සඳහා ගෘහස්ථ ක්‍රීඩාවලට වැඩි කැමැත්තක් දක්වන සිසුන් ආරම්භයේදී ම ලියාපදිංචි කර ගනු ලැබේ. එක්තරා වර්ෂයක දී ගෘහස්ථ ක්‍රීඩා සඳහා උපරිම ධාරිතාවට ශිෂ්‍යයන් ලියාපදිංචි වූ අතර, ඔවුන්ගෙන් 20% ක් එළිමහන් ක්‍රීඩා සඳහා ද ලියාපදිංචි වී ඇත. එළිමහන් ක්‍රීඩා සඳහා ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1300 ක් නම්, පාසලේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණ ද?
(1) 1600 (2) 1700 (3) 1800 (4) 1900 (5) 2000

[තුන්වැනි පිටුව බලන්න

AL අපි | @AL_api

Scanned with CamScanner

**19.** රූපයේ දී ඇති හැඩයට වෘත්තාකාර බිමක් සහ වෘත්තාකාර වහලක් සහිතව ගෙවතු ගිමන්හලක් ඉදි කර තිබේ. බිමෙහි වර්ගඵලය වර්ග මීටර 154 කි. වහලෙහි අරය, බිමෙහි අරය මෙන් 1.5 ගුණයක් නම්, වහලෙහි වර්ගඵලය වර්ග මීටර කීය ද?



(සටහන: වෘත්තයක වර්ගඵලය = $\pi r^2$, මෙහි $\pi = \frac{22}{7}$ සහ $r$ යනු අරය වේ.)

(1) 196.5 (2) 217.5 (3) 284.0 (4) 313.0 (5) 346.5

**20.** T-20 ක්‍රිකට් තරඟයක් ජය ගැනීම සඳහා කණ්ඩායමකට පිතිකරුවන්ගේ ඕවර 20 තුළ දී ලකුණු 190ක් රැස්කිරීමට සිදුවිය. එම කණ්ඩායමේ පිතිකරුවන් මුල් ඕවර 15 දී ඕවරයකට ලකුණු 8.8 බැගින් වන ලකුණු රැස් කිරීමේ වේගයක් පවත්වා ගත්තේ නම්, පිතිකරුවන්ගේ ඉතිරි ඕවර 5 දී ඔවුනට පවත්වා ගත යුතු වූ ලකුණු රැස්කිරීමේ අවම වේගය කුමක් ද?

(1) ඕවරයකට 11.6 (2) ඕවරයකට 10.2 (3) ඕවරයකට 9.5
(4) ඕවරයකට 9.15 (5) ඕවරයකට 0.7

**21.** එක්තරා වතුයායක, පොල් ගස් විශාල සංඛ්‍යාවකට අමතරව කොස් සහ දෙල් ගස් සැලකිය යුතු සංඛ්‍යාවක් ඇත. 2024 වර්ෂයේ දී මෙම එක් එක් වර්ගයෙහි ආදායම සහ නඩත්තු වියදම පහත වගුවෙහි දැක්වේ.


| ගස් වර්ගය | ආදායම (රුපියල් දහස්) | [illegible] දහස්) |
|---|---|---|
| පොල් | 16 250 | 1 250 |
| කොස් | 4 875 | 375 |
| දෙල් | 3 250 | 250 |

පහත දැක්වෙන කවරකින් පොල් : කොස් : දෙල් හි ලාභ අනුපාතය දැක්වේ ද?





(1) 12 : 4 : 3 (2) 10 : 5 : 4 (3) 10 : 4 : 3 (4) 10 : 3 : 2 (5) 9 : 2 : 1


- අංක 22 සිට 24 තෙක් ප්‍රශ්න පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

ඉමෝජිප්තු නම් කල්පිත ශිෂ්ටාචාරයකින් සොයාගන්නා ලද පැපිරස් පතක ඇතුළත් වූ පහත වගුවෙහි පළමුවන පේළියේ බිංදුවේ සිට හය තෙක් සංඛ්‍යා ($n$) ද දෙවැනි පේළියේ පහේ එම සංඛ්‍යාවල බල ($5^n$) ද ඉමෝජිප්තු සංඛ්‍යා ක්‍රමය අනුව සටහන් කොට තිබිණ.







**22.** ඉමෝජිප්තු ක්‍රමයට 2025 වසර පහත දැක්වෙන කවරක් ද?

(1)  (2)  (3) 
(4)  (5) 

**23.** ඉමෝජිප්තුවරුන්  ලෙස ලිවූ කවර සංඛ්‍යාව ද?

(1) 36 (2) 45 (3) 54 (4) 78 (5) 81

**24.** ගුණ කිරීම සඳහා ඉමෝජිප්තුවරුන්ගේ සංකේතය  නම්,  මගින් දැක්වෙන ඉමෝජිප්තු ප්‍රකාශනයෙහි අගය සොයන්න.

(1)  (2)  (3) 
(4)  (5) 

- අංක 25 සිට 27 තෙක් ප්‍රශ්න පහත දැක්වෙන විස්තරය මත පදනම් වේ.

එක්තරා කුරුමිණියෙක් සහ දළඹුවෙක් පස්වරු 4.00 ට යම් පත්‍රයක් අනුභව කිරීම ආරම්භ කළහ. සෑම පැයක දී
කුරුමිණියා තමන් මීට කලින් පැයේ දී අනුභව කළ ප්‍රමාණයෙන් හරි අඩක් අනුභව කළ අතර දළඹුවා තමන් මී
කලින් පැයේ දී අනුභව කළ ප්‍රමාණයෙන් හතරෙන් කොටසක් අනුභව කළේ ය. පස්වරු 6.00 සිට 7.00 දක්
ඒ එක් එක් කෘමියා වර්ග සෙන්ටිමීටරයකින් කාලක් බැගින් අනුභව කළහ.

**25.** පහත කවරක් **අසත්‍ය** වේ ද?

(1) පස්වරු 5.00 සිට 6.00 අතරතුර කිසියම් වේලාවක දී දළඹුවා 4.5 $cm^2$ ක් අනුභව කර අවසන් කළේ ය.
(2) පස්වරු 5.00 සිට 6.00 දක්වා දළඹුවා කුරුමිණියාට වඩා 0.5 $cm^2$ ක් අනුභව කර අවසන් කළේ ය.
(3) පස්වරු 7.00 සිට 8.00 දක්වා, දළඹුවා මෙන් දෙගුණයක් කුරුමිණියා අනුභව කළේ ය.
(4) මධ්‍යම රාත්‍රිය වනවිට දළඹුවාට 5.5 $cm^2$ ක් අනුභව කර අවසන් කිරීමට නොහැකි විය.
(5) පස්වරු 6.00 සිට 7.00 අතරතුර කිසියම් වේලාවක දී කුරුමිණියා 2 $cm^2$ ක් අනුභව කර අවසන් කළේ ය.

[හතරවැනි පිටුව බල

Scanned with CamScanner

26. දී ඇති ප්‍රකාශ නිශ්චිතව ම සිදුවන (A), සිදුවීමේ හැකියාව බෙහෙවින් වැඩි (B), සිදුවිය හැකි (C), සිදුවීමේ හැකියාව බෙහෙවින් අඩු (D) සහ කිසිසේත් ම සිදු නොවන (E) ලෙස පිළිවෙළින් වර්ග කර ඇති වරණය තෝරන්න.

- පස්වරු 7.55 සිට පස්වරු 8.55 දක්වා දළඹුවාට වඩා කුරුමිණියා අනුභව කළේ ය.
- පසු දිනයේ එක ම වේලාවට දෙදෙනා පත්‍රය කා දැමීම නවතා දමන විට, කුරුමිණියාට වඩා වැඩිපුර දළඹුවා අනුභව කොට තිබිණ.
- පස්වරු 7.00 සිට පස්වරු 7.10 අතරතුර දළඹුවාට වඩා වැඩි සීඝ්‍රතාවයකින් කුරුමිණියා පත්‍රය අනුභව කළේ ය.
- පසුදින දහවල් 12 වන විට දෙදෙනා ම එක්ව 8 $cm^2$ කට වඩා අනුභව කර සිටියෝ ය.
- පස්වරු 5.55 සිට පස්වරු 6.55 දක්වා, දළඹුවා නියත සීඝ්‍රතාවයකින් පත්‍රය අනුභව කළේ ය.

(1) A, B, C, D, E (2) B, A, C, E, D (3) B, C, A, D, E
(4) C, A, E, B, D (5) C, D, E, A, B


27. පස්වරු 7.00 වන විට කුරුමිණියා සහ දළඹුවා එක්ව පත්‍රයෙන් අඩක් අනුභව කළේ නම් එම පත්‍රයෙහි වර්ගඵලය වර්ග සෙන්ටිමීටරවලින් කොපමණ ද?

(1) 18 (2) 16 (3) 14 (4) 12 (5) 10

28. ඝනකයක මුහුණත් හය මත එක් තිතක්, තිත් දෙකක්, තිත් තුනක්, තිත් හතරක්, තිත් පහක් සහ තිත් හයක් ඕනෑම ප්‍රතිවිරුද්ධ මුහුණත් දෙකක් මත මුළු තිත් සංඛ්‍යාවෙහි එකතුව හතක් වන පරිදි වෙන් වෙන් ව තිත් සළකුණු කිරීමෙන් සම්මත දාදු කැටයක් නිපදවනු ලැබේ.

සම්මත දාදු කැට හතකින් සමන්විත සංයුක්ත වස්තුවක් පහත රූපයේ පරිදි නිපදවන්නේ යැයි සලකන්න.


- එක් දාදු කැටයක් සංයුක්ත වස්තුව මධ්‍යයෙහි සවි කරනු ලැබේ.
- එහි එක් එක් මුහුණත මත තවත් දාදු කැටයක් අලවනු ලබන්නේ, එසේ අලවනු ලබන මුහුණත් දෙකෙහි එකිනෙක මත ඇති තිත් සංඛ්‍යාව සමාන වන පරිදි ය.
- මෙම ආකාරයට මධ්‍යයෙහි ඇති දාදු කැටයෙහි මුහුණත් හය මත දාදු කැට හයක් අලවනු ලැබේ.



සංයුක්ත වස්තුවෙහි බාහිර මුහුණත් මත පෙනෙන මුළු තිත් සංඛ්‍යාවෙහි එකතුව කොපමණ ද?

(1) 84 (2) 91 (3) 105 (4) 126 (5) 133


29. සමාන දිගැති තුනී තල දර්පණ තුනක් සවි කර සමපාද ත්‍රිකෝණයක් නිපදවනු ලැබේ. රූපයෙහි පෙන්වා ඇති පරිදි ත්‍රිකෝණයේ කේන්ද්‍රයෙහි ඉතා කුඩා දිදුලන වස්තුවක් තැබූ විට, ආලෝකය පරාවර්තනය මගින් කොපමණ ප්‍රතිබිම්බ සංඛ්‍යාවක් සෑදෙන්නේ ද?



(1) 3 (2) 6 (3) 9 (4) 12 (5) 15

- අංක **30** සිට **32** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු පහත දැක්වෙන විස්තරය මත පදනම් වේ.

කාලයක් එක ම වර්ගයේ ඇඳුම් මැසීමෙහි නිරත වීමෙන් විශේෂ නිපුණතා අත් කරගැනීමට යන්ත්‍ර ක්‍රියාකරවන්නියකට පුළුවන. ඇය එක දිගට කමිස (හෝ කලිසම්) මැසීමෙහි නියැලීමෙන්, දෛනිකව මසනා කමිස (හෝ කලිසම්) සංඛ්‍යාව ඉහළ යන ආකාරය පහත ප්‍රස්තාරයෙහි දැක්වේ. යන්ත්‍ර ක්‍රියා කරවන්නිය සාමාන්‍යයෙන් දිනක් තුළ එක ම සීඝ්‍රතාවයෙන් ඇඳුම් මසන අතර, ඇණවුමක කිසියම් ඇඳුම් වර්ගයක් සම්පූර්ණයෙන් ම මසා අවසන් වූ විටෙක එම දවසේ වරුවක් හෝ ඊට වඩා තවත් කාලය තිබෙන අවස්ථාවක මිස, අන් හේතුවක් මත, එක් දිනක් තුළ තමා මසනා ඇඳුම් වර්ගය වෙනස් නොකරන්නී ය.



**30.** කමිස 300ක් පමණක් වන ඇණවුමක් අවසන් කිරීමට ඇයට දින කීයක් අවශ්‍ය වේ ද?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

**31.** කමිස 80ක සහ කලිසම් 140ක ඇණවුමක් ඇයට දින කීයකින් කාර්යක්ෂම ලෙස නිම කර දිය හැකි ද?

(1) 3 (2) 4 (3) 5 (4) 6 (5) 7

**32.** **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) යම් ඇඳුම් වර්ගයක් මසන සීඝ්‍රතාව, වෙනත් වර්ගයක් ආරම්භ කරන තුරු පහත නොවැටේ.
(2) කමිස සහ කලිසම් දෙවර්ගය ම සහිත ඇණවුමක් ලබා දුන් විට, එය අවසන් කරන දිනය, පළමුව මැසීමට ගන්නා වර්ගය අනුව වෙනස් නොවේ.
(3) පළමු දෙදින තුළ, කමිස මැසීමේ සීඝ්‍රතාව වෙනස් වන ප්‍රමාණය, කලිසම් මැසීමේ සීඝ්‍රතාව වෙනස් වන ප්‍රමාණයට වඩා වැඩි ය.
(4) දින තුනක් තුළ පමණක් මැසීම සිදුවන්නේ නම්, කමිස හෝ කලිසම් කවර වර්ගයක් වුව මැසෙන්නේ එක ම ඒකක සීඝ්‍රතාවෙනි.
(5) විශේෂ නිපුණතාව, කලිසම් මැසීමට වඩා කමිස මැසීම කෙරෙහි බලපෑම් සහගත වෙයි.

- අංක **33** සිට **37** දක්වා ප්‍රශ්න පහත විස්තරය මත පදනම් වේ.

අයිරින්, ජෝසපින්, රොසලින්, ඇන්ජලින් සහ කැතරින් යන මිතුරියන් පස් දෙනා, අහසෙහි ඉගිලෙන සරුංගල් දෙකක් නැරඹමින් ඒවායේ උස ගැන කළ කතාබහ පහත දැක්වේ.

අයිරින් : අර බලන්න! රතු සරුංගලේ අඩි 200කටත් උඩින් තියෙන්න ඕනැ. හැබැයි නිල් සරුංගලේ නම් අඩි 100කටවත් ගිහින් නෑ.

ජෝසපින් : වෙන්න බෑ. නිල් සරුංගලේ මට හොඳට පේන්නේ නෑ. හැබැයි රතු එක නම් අඩි 100කටත් පහළින් තියෙන්නෙ.

රොසලින් : නිල් සරුංගලේ මෙතැනට හොඳට පේනවා. ඒක අඩි 100කට උඩ. හැබැයි 200ක් නම් ගිහින් නෑ.

ඇන්ජලින් : ඇයි අනේ උඹලට රතු සරුංගලේ පේන්නේ නැද්ද? ඒක අනිවාර්යයෙන් අඩි 100කට උඩින් තියෙන්නේ.

කැතරින් : ඇත්තම කිව්වොත් ඇන්ජී, ඒක ඊටත් එහා ගිහින්. 200 පැනලා. නිල් සරුංගලේ ඊට පහළින් තියෙන්නේ. හැබැයි ඒකත් අඩි 100කට උඩින් තියෙන්නේ.

**33.** පහත සංවාදයේ සිටිය හැකි උපරිම සත්‍ය ප්‍රකාශ කරන්නන් ගණන කීය ද?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

**34.** සරුංගල්වල පහත උස මට්ටම්වලින් (අඩිවලින් ප්‍රකාශිත), සංවාදයෙහි සත්‍ය ප්‍රකාශ කරන්නන් නොමැති කරවන්නේ කුමක් ද?

(1) රතු - 100, නිල් - 120
(2) රතු - 90, නිල් - 200
(3) රතු - 120, නිල් - 90
(4) රතු - 100, නිල් - 220
(5) රතු - 90, නිල් - 220

**35.** සංවාදයෙහි සත්‍ය ප්‍රකාශ කරන්නේ දෙදෙනෙකු පමණක් නම් ඒ දෙදෙනා විය හැක්කේ කවුරුන් ද?

(1) අයිරින් සහ කැතරින්
(2) ජෝසපින් සහ රොසලින්
(3) කැතරින් සහ රොසලින්
(4) කැතරින් සහ ජෝසපින්
(5) අයිරින් සහ ජෝසපින්

**36.** නිල් සරුංගලය, එය දැන් පිහිටන උස මට්ටමෙන් යන්තම් අඩියක් පහළට ගියේ නම්, සත්‍ය ප්‍රකාශ කරන්නන් දෙදෙනෙකු අසත්‍ය ප්‍රකාශ කරන්නන් බවට පත් වේ. නිල් සරුංගලයේ දැන් උස මට්ටම කීය ද?

(1) අඩි 201 (2) අඩි 200 (3) අඩි 150 (4) අඩි 101 (5) අඩි 100

**37.** කිසිවකු සත්‍ය ප්‍රකාශ කරන්නේ නැතිනම් ද, සරුංගල් දෙකක් සම උසින් ඇත්නම් ද, ඒවායේ උස කොපමණ ද?

(1) අඩි 250
(2) අඩි 200
(3) අඩි 120
(4) අඩි 100
(5) නිර්ණය කිරීමට දත්ත ප්‍රමාණවත් නොවේ

AL අපි | @AL_api

[හයවැනි පිටුව බලන්න

Scanned with CamScanner

- අංක **38** සිට **40** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

ශීඝ්‍ර පාසලක 11 වන ශ්‍රේණියේ පළමුවන භාෂාව, ආගම, ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉතිහාසය සඳහා ඉහළ ම ලකුණු ලැබුවන් *P*, *Q*, *R*, *S*, *T* සහ *U* වන නමුත් ඒ දී ඇති විෂය අනුපිළිවෙළින් **නොවේ**. පහත දැක්වෙන තොරතුරු සලකා බලන්න:

- *P* සහ ඉතිහාසය විෂයයෙන් ඉහළ ම ලකුණු ලබා ඇති ශිෂ්‍යයා යන දෙදෙනා ම පිරිමි ළමයි වෙති.
- *Q* සහ විද්‍යාව විෂයයෙන් ඉහළ ම ලකුණු ලබා ඇති ශිෂ්‍යාව යන දෙදෙනා ම ගැහැනු ළමයි වෙති.
- පළමුවන භාෂාවෙහි සහ ගණිතයෙන් ඉහළ ම ලකුණු ලබා ඇත්තේ පිරිමි ළමයින් ය.
- ආගම විෂයයෙහි සහ ඉංග්‍රීසි භාෂාවෙහි ඉහළ ම ලකුණු ලබා ඇත්තේ ගැහැනු ළමයින් ය.
- *R* පිරිමි ළමයකු වන නමුත් ඔහු පළමුවන භාෂාවෙහි හෝ ගණිතයෙන් හෝ ඉහළ ම ලකුණු ලැබූ ශිෂ්‍යයා නොවේ.
- *S* ගැහැනු ළමයකු වන නමුත් ඇය ආගම විෂයයෙහි හෝ ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඉහළ ම ලකුණු ලැබූ ශිෂ්‍යාව නොවේ.
- *P*, පළමුවන භාෂාවෙහි ඉහළ ම ලකුණු ලැබූ අය නොවේ.
- *Q*, ආගම විෂයයෙහි ඉහළ ම ලකුණු ලැබූ අය නොවේ.

**38.** *P*, *Q*, *R* සහ *S* පිළිවෙළින් ඉහළ ම ලකුණු ලැබුවන් වන්නේ කුමන විෂයයන්වල ද?

(1) පළමුවන භාෂාව, ඉංග්‍රීසි භාෂාව, ඉතිහාසය, විද්‍යාව
(2) ගණිතය, ඉංග්‍රීසි භාෂාව, ඉතිහාසය, විද්‍යාව
(3) ඉතිහාසය, ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව
(4) ගණිතය, විද්‍යාව, ඉතිහාසය, ඉංග්‍රීසි භාෂාව
(5) ඉතිහාසය, විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි භාෂාව

**39.** *T* යනු පිරිමි ළමයකු නම්, ඔහු ඉහළ ම ලකුණු ලැබූ විෂයය කුමක් ද?

(1) පළමුවන භාෂාව (2) ආගම (3) ගණිතය
(4) ඉංග්‍රීසි භාෂාව (5) ඉතිහාසය

AL අපි | @AL_api

**40.** *T* යනු ගැහැණු ළමයකු නම්, ආගම සඳහා ඉහළ ම ලකුණු ලැබුවේ කවුරුන් ද?

(1) *Q* (2) *R* (3) *S* (4) *T* (5) *U*

- අංක **41** සිට **42** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

සාමාන්‍ය වෛද්‍ය ප්‍රතිකාරවල දී පොදුවේ භාවිත වන ඖෂධ වර්ග හයකට අදාළ තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

| ඖෂධය | භාවිතය | අතුරු ආබාධ | හානි |
|---|---|---|---|
| 1. පැරසිටමෝල් | උණ, හිසරදය | අක්මා හානි, ආමාශයේ තුවාල | සෙංගමාලය, අධිසංවේදීතාව |
| 2. මෙෆනමික් ඇසිඩ් | ආතරයිටිස්, උදරයේ වේදනාව | ආමාශ ප්‍රදාහය (Gastritis), ආමාශයේ තුවාල | ආමාශයේ තුවාල, වකුගඩු අක්‍රියවීම |
| 3. අයිබියුප්‍රෝෆන් | උණ, ප්‍රදාහය (Inflammation) | ඔක්කාරය, වමනය | අධිසංවේදීතාව |
| 4. පැන්ටොප්‍රසෝල් | වමනය, ආමාශයේ තුවාල | ශරීරය ඉදිමීම | අවුරුදු 10ට අඩු ළමුන්ට අධිසංවේදීතාව |
| 5. ඩොම්පෙරිඩොන් | ඔක්කාරය, වමනය | මුඛය වියළීම | අසාත්මිකතාව, අධිසංවේදීතාව |
| 6. ඇන්ටිහිස්ටමීන් | කැසීම, කාමි දද්වනය | මුඛය වියළීම | ගර්භණී සමයෙහි අධිසංවේදීතාව |

**41.** ඉහත සඳහන් ඖෂධ අතුරෙන් එක් ඖෂධයක් අධිසංවේදීතාවයෙන් පීඩා විඳින රෝගියෙක් සඳහා ද නිර්දේශ කළ හැකි ය. මෙම ඖෂධයේ අතුරු ආබාධ මොනවා ද?

(1) අක්මා හානි සහ ශරීරය ඉදිමීම (2) ආමාශ ප්‍රදාහය සහ ආමාශයේ තුවාල
(3) ඔක්කාරය සහ වමනය (4) ශරීරය ඉදිමීම සහ මුඛය වියළීම
(5) වමනය සහ මුඛය වියළීම

**42.** උණ සහ ප්‍රදාහයෙන් පීඩා විඳින රෝගියකුට නිර්දේශ කිරීමට සුදුසු ඖෂධ වර්ග දෙකක් වන්නේ

(1) පැරසිටමෝල් සහ මෙෆනමික් ඇසිඩ් ය. (2) අයිබියුප්‍රෝෆන් සහ ඩොම්පෙරිඩොන් ය.
(3) පැන්ටොප්‍රසෝල් සහ ඇන්ටිහිස්ටමීන් ය. (4) පැරසිටමෝල් සහ පැන්ටොප්‍රසෝල් ය.
(5) මෙෆනමික් ඇසිඩ් සහ ඇන්ටිහිස්ටමීන් ය.



Scanned with CamScanner

- අංක **43** සිට **44** තෙක් ප්‍රශ්න පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ එක්තරා විභාග මධ්‍යස්ථානයක ආගම ප්‍රධාන විෂය යටතේ එන බුද්ධ ධර්මය, ශෛවනෙරි, කතෝලික ධර්මය, ක්‍රිස්තියානි ධර්මය සහ ඉස්ලාම් ධර්මය යන විෂයයන් පහට වෙන වෙන ම පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාවට අදාළ සංඛ්‍යානමය තොරතුරු පහත වගුවේ දැක්වේ. පෙනී සිටි මුළු අපේක්ෂකයින් ගණන 160කි. එක් එක් අපේක්ෂකයා ඉහත දක්වා ඇති විෂයන් පහෙන් එකකට පමණක් පෙනී සිටින ලදී.

| විෂයය / මාධ්‍යය | බුද්ධ ධර්මය | ශෛවනෙරි | කතෝලික ධර්මය | ක්‍රිස්තියානි ධර්මය | ඉස්ලාම් ධර්මය |
|---|---|---|---|---|---|
| සිංහල | 90 | 00 | 04 | 01 | 05 |
| දෙමළ | 00 | 15 | 00 | 03 | 10 |
| ඉංග්‍රීසි | 10 | 05 | 06 | 06 | 05 |

**43.** මෙම විභාග මධ්‍යස්ථානයේ දි අපේක්ෂකයන් කී දෙනෙක් ඉස්ලාම් ධර්මය විෂයය සඳහා පෙනී සිටියෝ ද?
(1) 05 (2) 10 (3) 15 (4) 20 (5) 25

**44.** මෙම විභාග මධ්‍යස්ථානයේ දි අපේක්ෂකයන් කී දෙනෙක් සිංහල මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටියෝ ද?
(1) 95 (2) 100 (3) 105 (4) 110 (5) 115

**45.** මෙම ප්‍රශ්නයෙහි 1 සහ 7 මගින් අංකනය කර ඇති වාක්‍ය දෙක අතර ඇති *A, B, C, D, E* වාක්‍ය ඒවායෙහි නියමිත පටිපාටියෙහි **නොමැත**. වාක්‍ය හතෙහි තාර්කික අනුක්‍රමයක් සැකසීම සඳහා ඒවායෙහි නිවැරදි පිළියෙල කිරීම තෝරන්න.

1 – ශ්‍රී ලංකාවෙහි අකල් මරණ සඳහා හදිසි අනතුරු, වෙඩි තැබීම, කඩු සටන්, මත්ද්‍රව්‍ය, ලෙඩ රෝග සහ දිවි නසා ගැනීම වැනි විවිධ හේතු ඇත. මරණීය මාර්ග අනතුරු වසරෙන් වසර අනවරත ලෙස වැඩිවෙමින් පවතී.

*A* – රියදුරන් අතින් සිදුවන වැරදිවලට පරිබාහිරව, රියදුරුගේ නිදිබර ගතිය, රියදුරුගේ බීමත්කම, අධික වේගයෙන් රිය ධාවනය ප්‍රධාන අයහපත් කරුණු අතර වේ.

*B* – අත් අඩංගුවට ගැනීම රැසක් සහ ප්‍රසිද්ධ අපරාධකරුවන් අත් අඩංගුවට ගැනීම රැසක් තිබිය දී පවා මාර්ග අනතුරුවලට සමානව වෙඩි තැබීම්වලින් සිදුවන මරණවල අඩුවක් ද මෙම වසර තුළ දක්නට නොලැබේ.

*C* – මෙම වසරෙහි මුල් හය මාසය වනවිට මාර්ග අනතුරු 1274 ක් වාර්තා වී ඇති අතර මරණ 1351 ක් සිදුවී ඇති බව සංඛ්‍යාන වාර්තා පෙන්වා දෙයි. පසුගිය වසරෙහි මුල් හය මාසය තුළ මාර්ග අනතුරු 1166 ක් ද මරණ සංඛ්‍යාව 1222 ක් ද වේ.

*D* – මාර්ග අනතුරු සඳහා ප්‍රධාන වශයෙන් රියදුරන් අතින් සිදුවන වැරදි, මාර්ගවල ගැවසෙන අයාලේ යන සතුන්, අයහපත් සහ ප්‍රධාන වශයෙන් කදුරට ලිස්සන සුළු මාර්ග හේතු වේ.

*E* – පොලිස් නිලධාරීන්ගේ හැසිරීම පිළිබඳ දෝෂාරෝපණ ඇතත් රියදුරන්ගේ වැරදිවලට අමතරව රථවාහන පොලිස් නිලධාරීන් විසින් සොයා බැලිය යුතු කරුණු ද පවතී.

7 – මෙම සියලු ම කරුණු තිබිය දී, මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ තැතිගන්වන සුළු භයානක තත්ත්වයක් පවතී. මෙම භයානක තත්ත්වය තේරුම් ගෙන රජය විසින් කඩිනමින් මධ්‍යස්ථාන හතරකින් ආරම්භ කර එක් එක් පළාත සඳහා අවම වශයෙන් එක් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක්වත් ස්ථාපිත කිරීම සිදු කෙරේ.

(1) *C, D, A, E, B* (2) *C, D, B, A, E* (3) *C, E, D, A, B* (4) *D, A, E, B, C* (5) *D, A, E, C, B*

**46.** පහත දැක්වෙන සෑම *A, B, C, D* සහ *E* කොටසක් ම ප්‍රකාශ තුනකින් සමන්විත වේ.
අර්ථාන්විත අනුක්‍රමයක පෙළගැස්විය හැක්කේ ඒවායින් කුමන කොටසක අඩංගු ප්‍රකාශ තුන ද?

*A* (*a*) දවසෙහි උණුසුම් කාලයේ දී මී මැස්සන් මී වදය තුළ ක්‍රියාකාරී වේ.
(*b*) මී මැස්සෝ හිමිදිරි උදෑසන කාලයේ මී පැණි රැස් කරති.
(*c*) මල් ඵල ගැන්වෙන ගස් රාශියක් ඇති ප්‍රදේශවල සාමාන්‍යයෙන් මී වද දක්නට ලැබේ.

*B* (*a*) සුනඛයන් සහ බළලුන් ගෘහස්ථ සතුන් වේ.
(*b*) ගවයන් සහ එළුවන් ගම්මානවල නිවෙස් ආශ්‍රිතව කුඩා පරිමාණයෙන් ඇති කෙරේ.
(*c*) ගවයන් සහ එළුවන් ගොවිපළවල විශාල පරිමාණයෙන් ඇති කෙරේ.

*C* (*a*) බීජ, බීජාංකුර, නාරටි සහ මුල්වල කැපුම් ආදිය සාමාන්‍යයෙන් වගාවන්ට භාවිත කෙරේ.
(*b*) සුදුසු කාලයේ දී නියමිත කාල පරාසවලින් පොහොර සහ අනෙකුත් කෘෂි රසායනික යෙදීම ඉතා වැදගත් පියවරකි.
(*c*) අස්වනු නෙළීම සහ නිවැරදි පසු අස්වනු ගබඩා කිරීම කෘෂිකර්මයේ වැදගත් ක්‍රියාවලි වේ.

*D* (*a*) මදින ලද තල් ගසේ මලෙන් (කොලපුවෙන්) වැගිරෙන නැවුම් නොපැසුණු සාරය තෙලිදිය ලෙස හඳුන්වයි.
(*b*) හකුරු දුඹුරු සීනි සහ සුදු සීනි බවට හැරවිය හැකි ය.
(*c*) තෙලිදිය රත් කිරීමේ දී එය පැණි නමැති උකු ද්‍රාවණය බවට පත්වන අතර තවදුරටත් රත් කිරීමේ දී ඝන බවට පත්වන එය හකුරු ලෙස හඳුන්වයි.


*E* (*a*) ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශවල සිලිකා නමැති ඉතා සුදු පැහැති වැලි ස්වාභාවිකව පවතී.
(*b*) ඉදිකිරීම් කර්මාන්තය සඳහා සුදු වැලි භාවිත වේ.
(*c*) නිෂ්පාදන කර්මාන්තය සඳහා සුදු වැලි අමුද්‍රව්‍යයක් වේ.


(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*


[අටවැනි පිටුව බලන්න.

AL ඇපි @AL_api
Scanned with CamScanner


**47.** පහත රූපවලින් විස්තර වන සිදුවීම් සලකා බලන්න.



*A*


*B*


*C*


*D*


*E*


*F*

සිදුවීම්වල නිවැරදි අනුපිළිවෙළ ලබා දෙන පරිදි පින්තූර පෙළගැස්විය හැක්කේ මින් කුමන ආකාරයට ද?

(1) *C, A, E, B, D, F*  (2) *C, E, A, B, D, F*  (3) *C, E, A, F, B, D*
(4) *C, E, D, B, A, F*  (5) *E, C, A, B, F, D*

- අංක **48** සිට **50** තෙක් ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

මව සහ ඇගේ දියණියන් දෙදෙනා මිත්තණිය බැලීමට රෝහල් වාට්ටුවට ගියහ. එම වාට්ටුවේ ම යාබද ඇඳේ ප්‍රතිකාර ගනිමින් සිටි ගීලා නැන්දා ඔවුනට හමු විය. ඔවුන් වාට්ටුවේ සිටින අතරතුර ගීලාව බැලීමට ආ කරුණා ද ඔවුන්ට හමු විය. සියලු ම අමුත්තන්, මිනිබිරියන් දෙදෙනා, මව සහ කරුණා ආපසු නිවෙසට ආවේ කරුණාගේ වාහනයෙනි. ඔවුන් අතර සිදු වූ සංවාද *A* සිට *K* අක්ෂරවලින් පහත දී ඇති අතර ඒවා ඇත්තේ නිවැරදි අනුපිළිවෙළින් **නොවේ**.

*A* : ආ! අපේ මිතුරිය ගීලාත් නොමමර 06 අල්ලපු ඇඳේ ප්‍රතිකාර ගනිමින් ඉන්නවා දැකීම පුදුමයක්. ඒ වගේ ම ඇයගේ අමුත්තා, අපේ මිතුරිය කරුණා දැකීමත් සතුටක්. දැන් වෙලාව සවස 6ටත් ළං වෙලා. අපිට වාට්ටුවෙන් පිටත් වෙන්න වෙනවා.

*B* : අම්මෙ, අද හවස අපට ටියුෂන් පන්ති මොනවත් නැහැ. අනේ අපිවත් ආච්චි බලන්න ඉස්පිරිතාලෙට එක්කරගෙන යන්නකෝ.

*C* : ටැක්සිය ආවා. අපි යමු. ගිහින් එන්නම සීයේ.

*D* : අතන අංක 07 ඇඳ තියෙනවා, ආච්චි අපිව හොයනවා.

*E* : ඔව්, ඔයාලා හැමෝම දැක්කම ආච්චිට හරිම සතුටු හිතෙයි.

*F* : කරුණාකර වාට්ටු අංක 03, කාන්තා අංශය බලන්න.

*G* : ඔයාගේ උදව්වට ස්තුතියි කරුණා නැන්දේ. ඔයාගේ ළමයින්ව එක්කරගෙන ආවෙ නැත්තේ ඇයි?

*H* : ඔයාලා හැමෝටම මාත් එක්ක මගේ කාරෙකේ යන්න පුළුවන්.

*I* : ඔව් ඇත්තට ම, හොඳ විනෝදාංගයක් වගේ ම ඒක අපේ සෞඛ්‍යයටත් පාඩම් වැඩවලටත් හොඳයි.

*J* : ඒක ඉතා මිල අධිකයි.

*K* : මට පිරිමි ළමුන් තුන්දෙනෙක් ඉන්නවා. එයාලා තාත්තා එක්ක පීනන්න ගිහින්.

**48.** මව සහ දරුවන් අතර සංවාදවල ඇතැම් ස්වරූපයන් නිවැරදිව පෙළගස්වා ඇත්තේ මින් කවර සම්බන්ධයේ ද?

(1) *B, C, F, D, E*  (2) *B, E, C, F, D*  (3) *C, F, D, B, E*
(4) *C, F, D, E, B*  (5) *D, F, E, C, B*

**49.** කරුණා සහ දරුවන් අතර සංවාදවල ඇතැම් ස්වරූපයන් නිවැරදිව පෙළගස්වා ඇත්තේ මින් කවර සම්බන්ධයේ ද?

(1) *H, G, I, K, J*  (2) *H, G, J, K, I*  (3) *H, G, K, J, I*
(4) *I, J, K, G, H*  (5) *K, G, H, I, J*

**50.** සමස්ත සංවාදයේ තර්කානුකූල අනුක්‍රමය මින් කවරක් ද?

(1) *B, C, F, D, E, A, K, G, H, I, J*  (2) *B, E, C, F, D, A, H, G, K, J, I*
(3) *C, F, D, B, E, A, H, G, J, K, I*  (4) *C, F, D, E, B, A, H, G, J, K, I*
(5) *D, F, E, C, B, A, I, J, K, G, H*

***

Scanned with CamScanner